බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා කලා මණ්ඩලය**

# පුරප්පාඩු

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින 1952 අංක 18 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර - තනතුරු 01

| | | |
|---|---|---|
| පත්වීමේ ස්වභාවය | : | ස්ථිර |
| සේවා ගණය | : | කළමනාකරණ සහකාර - තාක්ෂණික - III ශ්‍රේණිය |
| වැටුප් කේතය | : | MA 2-1 - 2025 |
| වැටුප් පරිමාණය | : | රු. [50,540 - 10x540 - 7x630 - 4x890 - 20x1,190 - 87,710] |

**බඳවා ගැනීමේ සුදුසුකම්:**

<u>බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා</u>

අධ්‍යාපන සුදුසුකම් : තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

තනතුරට ආදළ වෙනත් විශේෂිත සුදුසුකම්:

- වෙබ් අඩවි නිර්මාණය හා සංවර්ධනය
- පරිගණක ග්‍රැෆික් නිර්මාණය
- ඉංග්‍රීසි/දෙමළ භාෂා පිළිබඳ නිපුණතාව
- වෘත්තීය පළපුරුද්ද

## කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) - තනතුරු 01

| | | |
|---|---|---|
| පත්වීමේ ස්වභාවය | : | ස්ථිර |
| සේවා ගණය | : | කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - III ශ්‍රේණිය |
| වැටුප් කේතය | : | MA 1-1 - 2025 |
| වැටුප් පරිමාණය | : | රු. [46,220 - 10x540 - 7x630 - 4x890 - 20x1,190 - 83,390/-] |

**බඳවා ගැනීමේ සුදුසුකම්:**

බාහිර අයදුම්කරුවන් සඳහා

අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල හෝ දෙමළ, ගණිතය, ඉංග්‍රීසි භාෂාව ඇතුළු විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව එක්වරකදී විෂයන් හයකින් (06) සමත්ව තිබීම.

**හා**

අ.පො.ස (උසස්පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයන් තුනක් (03) සමත්ව තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර).

**වෙනත් විශේෂිත සුදුසුකම්**

පරිගණක භාවිතය, ලිපි/වාර්තා සකස් කිරීම, දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය, ඉංග්‍රීසි/දෙමළ භාෂා පිළිබඳ නිපුණතාව, ආශ්‍රිත දැනුම හා වෘත්තීය පළපුරුද්ද විශේෂ සුදුසුකම් ලෙස සැලකේ.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයෙහි පහත 'අ', 'ආ' සහ 'ඇ' සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(අ) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල හෝ දෙමළ, ගණිතය, ඉංග්‍රීසි භාෂාව ඇතුලු විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව එක්වරකදී විෂයන් හයකින් (06) සමත් වීම.

- පරිගණක වදන් සැකසුම/යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අතිරේක සුදුසුකම් වශයෙන් සලකනු ලැබේ.

(ආ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතුය.

(ඇ) ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයෙහි නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026 ඔක්තෝබර් 09 වේ.

**සියලුම තනතුරු සඳහා වයස් සීමාව**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුයි. (ඉහළ වයස් සීමාව රාජ්‍ය සංස්ථා/මණ්ඩල/ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයින්ට අදාළ නොවේ.)

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනේ.

**සේවා නියුක්ත කරවීමේ කොන්දේසි**

බාහිර අයදුම්කරුවන් අතුරින් තෝරාගන්නා නිලධාරියෙකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් හා I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ. අභ්‍යන්තර අයදුම්කරුවන් අතුරින් දැනටමත් ආයතනයේ කිසියම් තනතුරක ස්ථිර කරනු ලැබ ඇති නිලධාරියෙකු තෝරාගනු ලැබූ විට කිසියම් වැඩබැලීමේ කාලසීමාවකට යටත් කරනු ලැබිය හැක.

**බඳවාගැනීමේ දී වැටුප**

ඉහත වැටුප් පරිමාණය 2025/03/25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව සඳහන් කර ඇති අතර එහි ආරම්භක වැටුප් පියවර 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ. බාහිර අයදුම්කරුවන් අතුරින් බඳවා ගැනීමේ දී අදාල තැනැත්තා වැටුප් පරිමාණයේ ආරම්භක පියවරෙහි පිහිටුවනු ලැබේ. අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේ දී පිහිටුවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ. රජයේ අනුමත අනෙකුත් දීමනාවලට හා සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදලට හිමිකම් සහිතයි.

**පොදු කොන්දේසි**

1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි හොඳින් ඉටුකිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුයි.
2. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුයි. එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3. බඳවා ගැනීම් සම්බන්ධයෙන් ඕනෑම අයුරකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් සේ සැලකේ.
4. මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ විධායක සභාවේ තීරණය අවසාන තීරණය වේ.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය**

1. අයදුම්පත ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ නිල වෙබ් අඩවියෙන් www.artscouncil.lk හෝ නිල ෆේස්බුක් පිටුව www.facebook.com/artscouncilofsrilanka ඔස්සේ බාගත කළ හැක. එසේත් නැතිනම්, එම ආකෘතිය පරිදි ඔබ විසින් සකස් කරගන්නා අයදුම්පත යොමු කළ යුතුය.
2. අයදුම්පත පැහැදිලි හා කියවිය හැකි වන පරිදි අත් අකුරින් හෝ පරිගණක ගත කර හෝ එවිය යුතුය.
3. අදාළ සහතිකවල පිටපත් හා වෘත්තීය සුදුසුකම් සනාථ කළ හැකි ලිපි අමුණා එවිය යුතු අතර ඒවා අයදුම්කරු විසින් ම අත්සන යොදා සහතික කර එවිය යුතුයි.
4. තනතුරු කිහිපයකට අයදුම් කරන්නේ නම්, එක් තනතුරකට එක බැගින් වන සේ අයදුම්පත් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතුය.
5. අයදුම්පත බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුරු නාමය සඳහන් කළ යුතුය.
6. වෙනත් ආයතනවල (රාජ්‍ය සංස්ථා/මණ්ඩලය/ව්‍යවස්ථාපිත ආයතන) සේවකයින්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් හරහා යොමු කළ යුතුයි.
7. නියමිත ආකෘතිය අනුව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසු ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.
9. සම්පූර්ණ කරන ලද අයදුම්පත හා සහතිකවල පිටපත් ද සහිතව පහත ලිපිනයට **ලියාපදිංචි තැපැලෙන් පමණක් ම එවිය යුතුය.**

සභාපති,
ශ්‍රී ලංකා කලා මණ්ඩලය
4 වන මහල,
සෙත්සිරිපාය දෙවන අදියර,
බත්තරමුල්ල.

**සම්පූර්ණ විස්තරය හා අයදුම්පත සඳහා www.artscouncil.lk වෙත පිවිසෙන්න.**

දුරකථන: 011-2177627

සභාපති, ශ්‍රී ලංකා කලා මණ්ඩලය, 4 වන මහළ, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල.